1940 අංක 9 දරණ
පුරාවස්තු ආඥාපනතේ සහ ඊට අදාල
උපකාරක නීතිවල

සිංහල පරිවර්තන

1997
ගවේෂණ සහ ලේඛණගතකිරීම් අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 7

## පුරාවස්තු

## 188 වන අධිකාරිය

## පුරාවස්තු

1940 අංක 9 දරන ආඥාපනත. ශ්‍රී ලංකාවේ පුරාවස්තු වඩා යහපත් ලෙස සුරක්ෂිත කිරීම සඳහා වූ ආඥාපනතකි.

1955 අංක 2
1955 අංක 22 දරන පනත්. (1940 ජුලි මස 15 වැනි දින)

කෙටි නාමය.

1. මේ ආඥාපනත පුරාවස්තු ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස
### පුරාවස්තුවල අයිතිය.

පුරාවස්තුවල අයිතිය

2. (1) යම් තැනැත්තකුගේ අයිතියෙහි වූ යම් ඉඩමක හෝ ඉඩමක් මත තිබී සොයා ගනු ලැබීමේ හේතුවෙන් පමණක් ම කිසිම පුරාවස්තුවක් ඒ තැනැත්තාගේ දේපල නොවිය යුතු ය. නැතහොත් එසේ සලකනු නොලැබිය යුතු ය.

එසේ වුවද, මේ ආඥාපනතෙහි විධිවිධාන අනුව ඒ තැනැත්තාට ඒ පුරාවස්තුව කෙරෙහි සම්බන්ධතාවක් ඇතැයි සලකනු ලැබිය යුතුය.

(2) මේ ආඥාපනත ක්‍රියාත්මක වන දිනයෙහි යම් තැනැත්තකුට අයිති නොවන, නැතහොත් භාරකරු, අධිපති හෝ කළමනාකරු වශයෙන් තැනැත්තකු කෙරෙහි පාලනය පවරා නොමැති සෑම පැරණි ස්මාරකයක් ම සම්පූර්ණයෙන් රජයේ දේපල වශයෙන් සලකනු ලැබිය යුතුය.

(3) භූතලය මතුපිට හෝ ඉන් යටත හෝ යම් ගංගාවක හෝ විලක හෝ පැතවී තිබෙන (පැරණි ස්මාරක හැර) සොයාගෙන නොමැති සියලු පුරාවස්තු, මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, සම්පූර්ණයෙන් ම රජයේ දේපල වශයෙන් සලකනු ලැබිය යුතු ය.

ඇතැම් පුරාවස්තුවල වෙළඳ අගය රජය විසින් ගෙවීම.

3. පැරණි ස්මාරකයක් හැර, යම් පුරාවස්තුවක් සොයා ගනු ලැබූ විට එම පුරාවස්තුව රජය විසින් තබා ගැනීම අවශ්‍ය යයි පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් සලකනු ලැබේ නම්, රජය වෙනුවෙන් පුරාවිද්‍යා කොමසාරිස්වරයාට එම පුරාවස්තුවේ භාරයට හා සන්තකයට අයිතියක් ඇත්තේ ය. තවද, රජය වෙනුවෙන් එම පුරාවස්තුව පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් තබා ගනු ලැබූ විට,-

(අ) පුරාවස්තුවේ වෙළඳ අගයෙන් දෙකෙන් කොටසක් එය සොයා ගනු ලැබූ තැනැත්තාට ද ඒ අගයෙන් දෙකෙන් කොටසක් පුරාවස්තුව සොයා ගනු ලැබූ ඉඩමේ අයිතිකරුට ද, නැතහොත්

(ආ) පුරාවස්තුව සොයා ගනු ලැබූ අය හා ඒ ඉඩමේ අයිතිකරු යන දෙදෙනාම එකම තැනැත්තා වන විට පුරාවස්තුවේ සම්පූර්ණ වෙළඳ අගය ඒ තැනැත්තාට ද, නැතහොත්

(ඇ) (පුරාවිද්‍යා කොමසාරිස්වරයා හෝ, මේ ආඥාපනත යටතේ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමේදී ඔහුගේ අධිකාරිය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු හැර) යම් තැනැත්තකු විසින් පුරාවස්තුව රජයේ ඉඩමක දී සොයා ගනු ලැබූ විට, පුරාවස්තුවේ වෙළඳ අගයෙන් දෙකෙන් කොටසක් එය සොයා ගනු ලැබූ අයට ද

රජය විසින් ගෙවනු ලැබියයුතු ය. එසේවුවද, යම් පුරාවස්තුව රජය විසින් තබා ගනු ලබන විට, එය සොයා ගත් බව, අවස්ථානෝචිත පරිදි 10 වන වගන්තියෙහි හෝ 14 වන වගන්තියෙහි හෝ විධිවිධාන අනුව වාර්තා කිරීම එය සොයා ගනු ලැබූ අය පැහැර හැර තිබෙන විට ඉහත සඳහන් පරිදි කිසිම ගෙවීමක් පුරාවස්තුව සොයා ගනු ලැබූ තැනැත්තාහට නොකළ යුතු ය.

රජයෙන් ගෙවීමක් නොමැතිව පුරාවස්තු කොටස් කර බෙදීම පිළිබඳ ගිවිසුම

4. (1) 3 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද යම් පුරාවස්තුවක වෙළෙඳ අගයට හෝ ඒ අගයෙහි යම් කොටසකට 3 වන වගන්තියෙහි විධිවිධාන යටතේ හිමිකම් ලැබිය යුතු යම් තැනැත්තෙකු සමග, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් ලිඛිත ගිවිසුමකට බැඳීම නීත්‍යානුකූල විය යුතුය. ඒ ගිවිසුමේ මාර්ගයෙන්, ඒ වෙළෙඳ අගය හෝ එහි කොටස හෝ වෙනුවට, ගිවිසුමෙහි සලස්වා ඇති ආකාරයෙන් කොටස්කර බෙදා දිය යුතු ඒ පුරාවස්තුවේ කොටසක් ඒ තැනැත්තාට රජයෙන් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ගිවිසුමක් ම මුද්දර ගාස්තුවෙන් නිදහස් වන අතර 3 වන වගන්තියෙහි කුමක් සඳහන් වුව ද ඒ ගිවිසුම බලාත්මක හා වලංගු වන්නේය.

එසේ වුවද සෑම විටම, යම් පුරාවස්තුවක් සොයා ගනු ලැබූ තැනැත්තා විසින් ඒ සොයා ගැනීම, අවස්ථාවේ පරිදි, 10 වන වගන්තියෙහි හෝ 14 වන වගන්තියෙහි විධිවිධාන අනුව වාර්තා නොකරන ලද අවස්ථාවක එබඳු යම් ගිවිසුමක් යටතේ ඒ පුරාවස්තුවෙහි යම් කොටසක් ලැබීමට ඔහුට හිමිකම් නොමැත්තේය.

වෙළෙඳ අගය හෝ පුරාවස්තු කොටස් කර බෙදීම සම්බන්ධයෙන් ආරවුල්

5. යම් පුරාවස්තුවක වෙළෙඳ අගය සම්බන්ධයෙන් හෝ 4 වන වගන්තිය යටතේ ගිවිසුමක් අනුව යම් පුරාවස්තුවක් කොටස් කර බෙදීම සම්බන්ධයෙන් හෝ පුරාවිද්‍යා කොමසාරිස්වරයා යම් තැනැත්තකු අතර යම් ආරාවුලක් ඇතිවූ විටෙක, ඒ ආරාවුල 45 වන වගන්තියෙහි සලස්වා ඇති ආකාරයෙන් තීරණය කළ යුතු අතර ඒ තීරණය අවසාන හා තීරණාත්මක වන්නේය.

11 වන කොටස

## පුරාවස්තු සොයාගැනීම කැණීම්

පුරාවිද්‍යා කොමසාරිස්වරයාගෙන් ලත් බලපත්‍රයක් අනුව මිස කැණීමක් නොකළ යුතු බව

6. මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට යටත්ව, පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, තමන්ට අයිති ඉඩමක හෝ අන් අයකුට අයිති ඉඩමක පුරාවස්තු සොයා ගැනීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින් කැණීම් නොකළ යුතුය.

එසේ වුවද පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ කරනු ලබන කැණීමකට මෙහි වගන්තියෙහි කිසිවක් අදාල නොවිය යුතු ය.

කැණීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම

7. කැණීම් සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස කෙරෙන සෑම ඉල්ලීමක් ම -

(අ) නියමිත ආකෘති පත්‍රය මගින් පුරාවිද්‍යා කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය ; තව ද,

(ආ) කැණීම් කිරීමට අදහස් කරනු ලබන ඉඩම් පිළිබඳ සම්පූර්ණවූත් නිවැරදි වූත් විස්තරයක් ද යෝජිත කැණීමේ ස්වභාවය හා ප්‍රමාණය ද නියම කරනු ලබන වෙනත් විස්තර ද එහි ඇතුලත් විය යුතුය.

කැණීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම

8. කැණීම සඳහා බලපත්‍රයක් ඉල්ලීමකට, ස්වකීය අභිමතය පරිදි ඉඩදීම හෝ එවැන්නක් ප්‍රතික්ෂේප කිරීම හෝ පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් කළ හැකිය.

එසේ වුවද අවශ්‍ය යයි පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් සලකනු ලබන පරීක්ෂණයකින් පසු පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔහු සෑහීමකට පත්වුවහොත් මිස, එබඳු කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය :-

(අ) කැණීම් සිදු කිරීමට අදහස් කරන ඉඩමේ අයිතිකරු කැණීම් සඳහා අනුමැතිය දී ඇති බව ; හා

(ආ) ඒ ඉඩම් සමීපයෙහි පදිංචිව සිටින තැනැත්තන්ට හෝ ආගමික කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයකට හෝ යම් සුසාන භූමියකට, පාසලකට, ජලඋත්පාදකයකට, වාරි කර්මාන්තයකට හෝ ප්‍රසිද්ධ පාරකට යම් අලාභ හානියක් හෝ අපහසුවක් යෝජිත කැණීමෙන් සිදු නොවන බව හෝ එබඳු යම් අලාභ හානියක් සිදු විය හැකි නම්, ඒ සම්බන්ධයෙන් වන්දි ගෙවීම සඳහා ඉල්ලුම්කරු විසින් ප්‍රමාණවත් විධිවිධාන සලස්වා ඇති බව ; හා

(ඇ) මේ ආඥාපනතේ හෝ යම් නියෝගයක හෝ විධිවිධාන ද බලපත්‍රය යම් කොන්දේසිවලට යටත් කොට නිකුත් කෙරේ ද ඒ කොන්දේසි ද නිසි පරිදි පිළිපදිනු ලබන බවට ඇප තැබීමට ඉල්ලුම්කරු [illegible] හා

බලපත්‍රයේ නියමයන්

9. කැණීම සඳහා වූ සෑම බලපත්‍රයක් ම [illegible] යටත්ව නියමිත ආකෘති පත්‍රයෙහි නිකුත් කළ යුතු අතර බලපත්‍රයෙහි සඳහන් කාලසීමාව තුළ 11 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එය වලංගු විය යුතුය.

එබඳු යම් බලපත්‍රයක, නියමිත කොන්දේසිවලට අතිරේකව, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍යයයි පුරාවිද්‍යා කොමසාරිස්වරයා විසින් සලකනු ලබන නියමයන්